

# මෑත යුගයේ ආශ්චර්යමත්ම පුරාවිද්‍යා ගවේෂණය ලුම්බිනියෙන් හෙළිවන නව තොරතුරු

තුසිත මලලසේකර



නේපාලය හිමාල කඳු පාමුල පිහිටි රාජ්‍යයකි. එරට අගනුවර වන කත්මන්ඩු නුවරට කිලෝමීටර් 300ක් පමණ නිරිත දිගින් පිහිටි රූමින්දෙහි දිස්ත්‍රික්කයෙහි නිම්න භූමියක ලුම්බිනිය පිහිටා ඇත. අතීත ලුම්බිනිය මලින් පිරුණු ගස්වලින් සමන්විතවූ මනරම් වනෝද්‍යානයක්ව පැවති බව ඓතිහාසික මූලාශ්‍ර දක්වයි. විශේෂයෙන්ම ''*ෂොරියා රොබස්ටා*'' (*Shorea robusta*) නම් විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන සල්ගස් ලුම්බිනි උද්‍යානය පුරා පැවතුනි. එහෙයින් එය එකල ක්ෂත්‍රිය රජවරුන් මෙන්ම ඔවුන්ගේ වැසියන්ටත් සිත්සේ විනෝද සුව විඳින්නට අවස්ථාව සලසා දුන් මනස්කාන්ත උයනක් ලෙස තිබෙන්නට ඇත.

කිඹුල්වත් නුවර රජ කළ සුද්ධෝදන රජතුමාගෙ අගමෙහෙසිය වූ මහාමායා දේවිය සිය දරු ප්‍රසවය සඳහා මවුබිම වූ දෙව්ගහ නුවරට පිරිස් පිරිවරා යන විට ලුම්බිනි සල් උයනේ නැවතී එහි පරිසරය රස විඳීමට සහ ගිමන් නිවීමට සිතා ගමන මදකට නවතා ලීය. බෞද්ධ ඉතිහාසයට අනුව මෙම සල් උයනේ සල් ගසක් මුලදී සිද්ධාර්ථ කුමරුට උපත දුන් බව පළවෙයි. එම බෝසත් උපත ක්‍රිස්තු පූර්ව 642 වර්ෂයේ වෙසක් (මැයි) පසලොස්වක පොහෝ දින සිදුවූ බව පිළිගැනෙයි.

බුදුරජාණන් වහන්සේට-සිද්ධාර්ථ ගෞතම කුමරුට උපත දුන් ස්ථානය ලෙස පිළිගැනෙන නිසා ලුම්බිනියට වර්ෂයක් පාසා පැමිණෙන වන්දනාකරුවන්ගේ සංඛ්‍යාව අති විශාලය. බුදුරජාණන් වහන්සේද තම පරිනිබ්බාන සූත්‍රය තුළින් බෞද්ධයන් විසින් වන්දනාමාන කළ යුතු ස්ථාන 4ක් - උපත සිදුවූ ලුම්බිනිය, බුද්ධත්වයට පත්වූ බුද්ධගයාව ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ ඉසිපතනය සහ පරිනිර්වාණය සිදුවූ කුසිනාරාව නම් කර ඇත. මේ සියලු ස්ථාන එදා ගහකොළ පැවැති ස්වභාවික ස්ථාන වූ බැවින් බුදුරජාණන් වහන්සේ පරිසරයට, වෘක්ෂලතාදියට සහ ස්වභාවධර්මයට කොතරම් කැමැත්තක් දැක්වූයේද යන්න වටහා ගත හැකිය.

ඓතිහාසික තොරතුරුවලට අනුව ක්‍රිස්තු පූර්ව 249 වර්ෂයේදී මෞර්ය වංශික අශෝක නම් බුද්ධාගම වැළඳගත් ඉන්දීය අධිරාජයා සිය ගුරුවූ උපගුප්තත් සමග බුදුන් උපන් ලුම්බිනියට පැමිණෙන විට එහි තිබී ඇත්තේ සශ්‍රීක ගමකින් වටවූ උද්‍යානයකි. එතැන ස්ථූප 4ක් සහ මුදුනෙහි අශ්ව රුවක් රැගත්



ලුම්බිනි උයනෙහි වත්මන් ජායාරූපයක්



**ලුම්බිනි උයනෙහි කැණීම් කටයුතු සිදුකෙරෙන ජායාරූපයක්**

කුළුනක් (ස්ථම්භයක්) ඉදිකළ අශෝක රජතුමා එහි බ්‍රාහ්මී අක්ෂර යොදා පාලි භාෂාවෙන් කළ සටහනෙහි මෙසේ සඳහන්ව ඇත.

''දෙවියන්ට ප්‍රියවූ ප්‍රියදර්ශී රජු (අශෝක) තම කිරුළපලන් මංගල්ලයෙන් 20 වසරක් ගෙවුන තැන තිලෝමුනි බුදුරජාණන් උපන් තැනට රාජකීය සංචාරයෙන් පැමිණ වන්දනාමාන කර ගල් තාප්පයක් බඳවා ස්ථම්භයක්ද උන්වහන්සේට ගෞරව පිණිස ඉදි කරනු ලැබීය. එසේම ලුම්බිනි වැසියන් රජුට ගෙවිය යුතු බදු ප්‍රමාණයද 1/8 පංගුවකට පහත හෙළනු ලැබීය''

ලුම්බිනිය පසුකලෙක හඳුනාගැනීමට පහසු වූයේ මෙම අශෝක කුළුන හේතුවෙනි.

ක්‍රිස්තුවර්ෂයෙන් 15 වන සියවස දක්වා ලුම්බිනියට විවිධ වන්දනාකරුවන් පැමිණි බවට සාක්ෂි ඇත. චීන දේශගවේෂකයන් විශේෂයෙන්ම ෆා-හියුන් (ක්‍රි.ව. 4 වන සියවසේදී) සු ඇන් ට්සැන්ග් (ක්‍රි.ව. 7 වන සියවසේදී) මෙහි පැමිණි බවට සටහන් ඇත. ක්‍රි.ව. 14 වන සියවසේදී මල්ල රජකු මෙම ස්ථානය වන්දනා කර ඇති බවටද ඓතිහාසික තොරතුරු ඇත. එහෙත් ක්‍රි.ව. 15 වන සියවසෙන් පසුව ලුම්බිනිය පාලුවට සහ කැලෑවට වැසීගිය ප්‍රදේශයක් බවට හා නටබුන් බවට පත්විය. වර්ෂ 1896 දී ආචාර්ය ඒ.ෆර්හර් නම් ජර්මන් ජාතික පුරා විද්‍යාඥයා කහඩ්ජා සම්ෂෙර් නම් ප්‍රදේශයේ ආණ්ඩුකාරයා සමග අශෝක කුළුණ සොයාගැනීමත් සමඟ ලුම්බිනිය නැවතත් මාතෘකාවක් බවට පත්විය. එයින් පසුව සිදු කළ විවිධ ගවේෂණ හා කැණීම් තුළින් මායාදේවී විහාරය, විවිධ ස්තූප මෙන්ම විහාරයට දකුණේ පිහිටි 'පුස්කාර්නි' නම් විලද සොයාගනු ලැබුණි. සිද්ධාර්ථ කුමරුට උපත දෙන්නට පෙර මහාමායා දේවිය මෙම විලෙන් ස්නානය කළ බවටද මතයක් පවතියි.

වර්ෂ 1997 දී ලුම්බිනිය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්වූ අතර එතැන් පටන් නේපාල රජයේද සහාය ඇතිව කත්මන්ඩු නුවර යුනෙස්කෝ කාර්යාලය සියලු ගවේෂණ සම්බන්ධීකරණය කරයි.

ලෝක උරුම ගවේෂණ වැඩසටහන යටතේ ලෝක උරුමයක් වූ බුදුරජාණන් වහන්සේගේ උපත සිදුවූ ස්ථානය : ලුම්බිනිය සංරක්ෂණ, ශක්තිමත් කිරීම සහ කළමනාකරණ ව්‍යාපෘතිය යුනෙස්කෝවේ මූලිකත්වයෙන් ආරම්භවූයේ ඉන් පසුවය.

ලොව පුරා සිදු වන පුරාවිද්‍යාත්මක ගවේෂණ අතරින් මෑත කාලයේදී මහත් කතාබහට ලක්වූ ගවේෂණයක් ලෙස නේපාලයේ ලුම්බිනි සල් උයන පාදක කරගෙන සිදුකරන මෙම ගවේෂණ දැක්විය හැකිය. නේපාලයේ ගවේෂණ කටයුතුවල නියැලි පුරා විද්‍යාඥයන් විසින් සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ කුමරු ලෙස උපත ලැබූ ස්ථානය තහවුරු කරන ක්‍රිස්තු පූර්ව 6 වන සියවස තරම් පැරණි පුරා විද්‍යාත්මක ව්‍යුහ සොයාගැනීමට සමත්ව ඇත. සිදුහත් උපත පිළිබඳව නිශ්චිත වශයෙන්ම ශතවර්ෂයකට ඉලක්ක කර ගත් සොයාගැනීම මෙය වීම විශේෂයකි.

යුනෙස්කෝවේ ලෝක උරුමයක් ලෙස සැලකෙන නේපාලයේ ලුම්බිනි පූජනීය සල් උයන බොහෝ කලෙක සිටම සිදුහත් උපත සිදුවූ ස්ථානය බවට පුරාණ ග්‍රන්ථ, මුඛ සාක්ෂි සහ වෙනත් තොරතුරු මගින් තහවුරු කර තිබුණද නිශ්චිත සාක්ෂි හෙළිදරව් කළ ගවේෂණයක් ලෙස මෙම ගවේෂණය පිළිගැනේ. මෙහිදී මෙයට පෙර අනාවරණය නොවූ දැව ව්‍යුහයක් හමුවූයේ ගඩොලින් තැනූ ගොඩනැගිලි ගණනාවක නෂ්ඨාවශේෂවලට පහළිනි. ඉහළින් පිහිටි ව්‍යුහයන්ට සමාන සැලසුමකින් යුක්ත වූ මෙම දැව නිර්මාණය මැද පිහිටි විවෘත ප්‍රදේශය බුද්ධෝත්පාදය සිදුවූ ස්ථානය ලෙස පුරාවිද්‍යාඥයෝ විශ්වාසය පළ කරති.

මෙම පුරාවිද්‍යාත්මක ගවේෂණය මෙහෙයවන, එක්සත් රාජධානියේ ඩර්හැම් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රොබින් කොනිග්හම් පුරාවිද්‍යාඥයා පවසන්නේ පුරාණ ග්‍රන්ථ, හා මුඛ සාක්ෂි පදනම් කරගෙන බොහෝ විද්වතුන් බුදු උපත සිදුවූයේ ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේ බව පළ කර තිබුණද දැන් ප්‍රථමවරට ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ ලුම්බිනි උයනේ පැවති දැව ගොඩනැගිල්ලක පිළිබඳ සාක්ෂි හමුව ඇති බවය.

නේපාලයේ ලුම්බිනි බුද්ධෝත්පාද සල් උයන් කැණීම් යුනෙස්කෝවේ මෙහෙයවීම යටතේ ජපාන රජය (ලෝක සංස්කෘතික උරුම සංරක්ෂණ

භාර අරමුදල) සහ නේපාල රජය හවුල්ව සිදුකරයි. එසේම ඒ සඳහා එක්සත් රාජධානියේ ඩර්හැම් සහ ස්ටර්ලින්ග් සරසවිවලින් හා ජාතික භූගෝලීය සමාජයේ ගෝලීය ගවේෂණ අරමුදලෙන් මූල්‍යාධාර හා සම්පත් සැපයෙයි. මහාචාර්ය රොබින් කොනිග්හැම් සමග නේපාලයේ ඉතා ප්‍රකට පුරා විද්‍යාඥයෙකු වන කෝෂ් ප්‍රසාද් ආචාර්යාද මෙම ගවේෂණ කණ්ඩායම මෙහෙයවයි.

ලුම්බිනියෙහි දැනට සිදුකරමින් පවතින පුරාවිද්‍යාත්මක කැණීම් හා ගවේෂණ මගින් ක්‍රි.පූ. 3 වන සියවසේදී එනම් අශෝක යුගයට පෙර පැවති ඉදිකිරීම් ගැන නව තොරතුරු රාශියක් අනාවරණය කරනු ඇතැයි අපේක්ෂිතය. මෙහිදී ලුම්බිනියෙහි පිහිටි පැරණි මායාදේවි විහාරය, උද්‍යානයේ නැගෙනහිර පිහිටි සංඝාවාස ප්‍රදේශය සහ මෙතෙක් ගවේෂණයට ලක් නොවූ උද්‍යානයේ දකුණු ප්‍රදේශයේ ස්ථාන 2ක් කෙරෙහි වැඩි අවධානයක් යොමුකිරීමට අපේක්ෂිතය.

වර්ෂ 2010 දී ආරම්භ කළ මෙම ගවේෂණයේදී මායාදේවි විහාරයේ කැණීම් පර්යේෂණ 2011 දී ආරම්භ කළ අතර එමගින් හෙළිදරව් කරගෙන ඇත්තේ අශෝක රජතුමා විසින් තැනූ ගඩොල් විහාරයට පෙර වෙනත් ප්‍රධාන විහාරයක් එහි පැවති බවය. 2013 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඔවුන්ගේ උත්සාහය වී ඇත්තේ මෙම පෞරාණික විහාරයේ ස්වභාවය හෙළිදරව් කරගැනීමට අවශ්‍ය දත්ත, සාක්ෂි හා තොරතුරු සොයාගැනීමය. මෙම ගවේෂණ මගින් මායාදේවි විහාරයට නිරිත දිග ප්‍රදේශයේ ඇති දකුණු ආසියාවේ පැරණිතම, නමින් හඳුන්වන ලද ග්‍රාමයක් ලෙස සැලකිය හැකි ලුම්බිනි ග්‍රාමයෙහි පැරණි ජනාවාස පැවති බව අනාවරණය කර ගැනීමට සමත්ව ඇත.





ලුම්බිනි උයනෙහි කැණීම් කටයුතු සිදුකෙරෙන තවත් ඡායාරූපයක්

තම වර්තමාන සොයා ගැනීම් පිළිබඳව 2013 ජූලි මාසයේදී ප්‍රකාශයක් සිදු කළ මහාචාර්ය රොබින් කොනිග්හැම් සහ පුරාවිද්‍යාඥ කෝෂ් ප්‍රසාද් ආචාර්යා පවසා සිටියේ මෙතෙක් අපගේ පිළිගැනීම ලෙස පැවති ක්‍රි.පූ. 3 වන සියවසේදී අශෝක අධිරාජයා විසින් මෙම කලාපය පුරාම බුද්ධාගම පතුරුවාලීමට සිදුකළ කර්තව්‍යයේදී ලුම්බිනියෙහි ගඩොලින් ඉදි කළ විහාරය කරවූ බව වුවත් මෙම කැණීම්වලින් අශෝක යුගයට පෙර ඉදිකළ ගඩොලින් තැනූ විහාරයක්ද එයට පහළින් දැව නිර්මාණයක්ද පැවති බව හෙළිදරව් වී ඇති බව ඔවුහු පළ කළහ.

මෙම පුරාවිද්‍යාත්මක ගවේෂණ තොරතුරු විශ්ලේෂණය කරන විට බුද්ධචරිතය පිළිබඳ නව තොරතුරු ලැබ බුද්ධෝත්පත්තිය හා එය සිදුවූ ආකාරයද වඩා පැහැදිළි වනු ඇත. එසේම මෙතෙක් කල් ක්‍රි.පූ. 3 වන සියවසේදී සිදු වූයේ යැයි විශ්වාස කෙරෙන බුද්ධෝත්පත්තිය ඇත්ත වශයෙන්ම සිදු වූයේ ක්‍රි.පූ. 6 වන සියවසේදීද යන්න මෙන්ම බුද්ධෝත්පත්තියට පෙරත් ලුම්බිනිය වන්දනාවට පාත්‍රවූ තැනක්ද යන්න පිළිබඳ නව තොරතුරු විශ්ලේෂණය හා නිගමනය අනාගතයට පැවරෙනු ඇත.

**තුසිත මලලසේකර**
(අන්තර්ජාල තොරතුරු ඇසුරින් සැකසීය)
0718172766